www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: සසප සහ සසජාශි පලාත් සභා මැතිවරන උද්ඝෝෂනය දියත් කිරීමේ රැස්වීමක් පැවැත්වීමට යයි

## Sri Lanka: SEP and ISSE public meeting to launch provincial election campaign

**2009 ජනවාරි 7**

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ශ්‍රී ලංකා ශාඛාව වන සමාජවාදී සමානතා පක්ෂය (සසප) 2009 පෙබරවාරි 14 දා පැවැත්වීමට නියමිත පලාත් සභා මැතිවරන දෙක තරඟ කරයි. අපගේ මැතිවරන උද්ඝෝෂනය දියත් කරනු වස් සසප සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) හෙට, ජනවාරි 8 දා, කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරයේ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

සසප මධ්‍යම හා වයඹ පලාත්වල පිලිවෙලින් නුවරඑලිය හා පුත්තලම දිස්ත්‍රික්ක සඳහා අපේක්ෂකයන් 38ක් ඉදිරිපත් කරනු ඇත. නුවරඑලිය දිස්ත්‍රික්කය ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ වඩාත්ම පීඩිත ස්ථරය වන දෙමල කතා කරන වතු කම්කරුවන්ගෙන් බහුතරයක වාසභූමිය වන මධ්‍යම කඳුකරයේ පිහිටා තිබේ. පුත්තලම් දිස්ත්‍රික්කය තුල ජනවාර්ගික සිංහල, මුස්ලිම් හා දෙමල ජනයාගෙන් සමන්විත මිශ්‍ර ජනගහනයක් සිටින අතර ධීවර කර්මාන්තය එහි මූලික වෘත්තියයි.

25 වසරක් තිස්සේ දිගට ඇදෙන වර්ගවාදී යුද්ධය වහාම නතර කරන ලෙසත් රටේ උතුරෙන් හා නැගෙනහිරෙන් ආන්ඩුවේ සියලු හමුදා වහාම ඉවත් කරන ලෙසත් ඉල්ලා සිටිනු පිනිස සසප මැතිවරනය තුල මැදිහත් වේ.

ජනාධිපති මහින්ද රාජපක්ෂ, පසුගිය සිකුරාදා ශ්‍රී ලංකා මිලිටරිය කිලිනොච්චිය අල්ලාගැනීම යුද්ධය අවසන් කොට සාමය උදා කිරීම පිලිබඳ පෙරනිමිත්තක් වන ප්‍රධාන ජයග්‍රහනයක් ලෙස හුවා දක්වන නමුදු, එය එවැන්නක් නම් නොවේ. එය යොදා ගැනෙනු ඇත්තේ, රටේ දෙමල ජනගහනයට එරෙහිව තව දුරටත් මෘගත්වය යොදා ගැනීම සහ සමස්තයක් ලෙස සමාජයේ වැඩෙන මිලිටරීකරනය උත්සන්න කරනු පිනිසය.

රාජපක්ෂ යුද්ධය යලි දියත් කිරීමත් සිංහල ස්වෝත්තමවාදය යලි ඇවිලීමත් වනාහි, සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ බහුතරයකට බලපාන බැරෑරුම් සමාජ ගැටලු එකකට වත් ආමන්ත්‍රනය කිරීමට ඔහුගේ ආන්ඩුවට ඇති නොහැකියාවේ ප්‍රතිඵලයක් සහ එහි පිලිවෙත් සම්බන්ධයෙන් වැඩෙන මහජන අසන්තෘප්තිය අපසරනය කිරීමේ ප්‍රයත්නයකි.

දැන් ගෝලීය ආර්ථික පසුබෑස්ම හා නය හැකිලීම සමග සංයුක්ත වී ඇති ආන්ඩුවේ දැවැන්ත යුද වියදමේ ප්‍රතිඵලයක් ලෙස රටේ ආර්ථික අර්බුදය දිනපතා ගැඹුරු වේ. රාජපක්ෂගේ න්‍යාය පත්‍රය වන්නේ, මෙම අර්බුදයේ මුලු බර ම ජීවන මට්ටම්වලට, සමාජ කොන්දේසිවලට සහ මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන්වලට එල්ල කෙරෙන ප්‍රහාරයක රූපාකාරයෙන් සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ කර මත සෘජුව ම පැටවීමයි.

කොලඹ පාලක ප්‍රභූවේ සෑම කොටසක් ම රාජපක්ෂගේ ජරා යුද්ධයේ හවුල්කරුවන්ව සිටිති. යුද්ධය පොලඹාලීම සම්බන්ධයෙන් ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කල සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුනේ (ජවිපෙ) සිට ප්‍රධාන විපාර්ශ්වය වන එක්සත් ජාතික පක්ෂය (එජාප) දක්වා, සියල්ලෝ ම මිලිටරියට හා යුද්ධයට පවතින සිය පක්ෂපාතිත්වය ගැන ප්‍රතිඥා දී තිබේ. කම්කරු පන්තියේ -- සිංහල, දෙමල හා මුස්ලිම් එක සේ -- ප්‍රජාතන්ත්‍ර හා සමාජ අභිලාෂයන්ට ආමන්ත්‍රනය කිරීමෙහි ලා ඔවුහු ඓන්ද්‍රීයව හා ඓතිහාසිකව අසමත්ය.

එල්ටීටීඊය සම්බන්ධයෙන් ගතහොත්, එහි බෙදුම්වාදී වැඩපිලිවෙල නියෝජනය කරන්නේ, දෙමල මහජනතාවගේ නොව, ආනුභාවයේ හා ලාභ ගැරීමේ තමන්ගේ ම වැයික්කියක් තහවුරු කරගනු පිනිස විවිධ අධිරාජ්‍යවාදී බලවතුන් අතර උපාමාරු දැමීමේ අවශ්‍යතාවයෙන් පෙලෙන නැග එන දෙමල ධනේශ්වරයක අවශ්‍යතාය.

යුද්ධය අවසන් කොට කම්කරු පන්තියේ හා මහජනතාවන්ගේ සමාජ හා ප්‍රජාතන්ත්‍ර ගැටලුවලට ආමන්ත්‍රනය කරනු වස් සමාජවාදී ජාත්‍යන්තරවාදය මත පදනම් වන, ශක්‍ය ඉදිරිදර්ශනයක් සම්පාදනය කරන එකම පක්ෂය සසප යි. දකුනු ආසියාවේ සමාජවාදී සමූහාන්ඩු සංගමයක කොටසක් ලෙස ශ්‍රී ලංකා-ඊලම් සමාජවාදී සමූහාන්ඩුවක රූපාකාරයෙන් කම්කරු-ගොවි ආන්ඩුවක් ගොඩනගන ලෙස අපි කැඳවුම් කරමු. සසප සහ සසජාශි එලඹෙන පලාත්

සහා මැතිවරන තුල දී මෙම ඉදිරිදර්ශනය සඳහා බලගතු ලෙස උද්ඝෝෂනය කරනු ඇත.

ප්‍රසිද්ධ රැස්වීමට පැමින අපගේ විශලේෂනයට හා ක්‍රියාමාර්ගයට ඇහුම්කන් දී ඒ පිලිබඳ සාකච්ඡා කරන ලෙසත් අපගේ මැතිවරන උද්ඝෝෂනයට සහභාගි වන ලෙසත් අපි කම්කරුවන්ට, තරුන ජනයාට හා බුද්ධිමතුන්ට ආරාධනා කරමු .

**ස්ථානයඃ මහජන පුස්තකාල ශ්‍රවනාගාරය, කොලඹ 7**

**වේලාවඃ ජනවාරි 8 වන බ්‍රහස්පතින්දා සවස 4.00ට**

© www.wsws.org